දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය
எனது இல.
My No.
PSC/APL/12/113/2025

ඔබේ අංකය
உமது இல.
Your No.
MOJ/E4/Annual Transfer-2024

දිනය
திகதி
Date
2026.08.11

---

ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

**<u>අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා, අධිකරණ සෝෂක හා ප්‍රවේශක, පිස්කල් පියන්, පිස්කල් භාරකාර මාතා, අධිකරණ ආරක්ෂක නිලධාරීන්ගේ 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**

උක්ත කරුණ සම්බන්ධව ඔබේ සමාංක හා 2026.02.02, 2026.03.12 හා 2026.03.16 දිනැති ලිපි හා බැඳේ.

02) අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා, අධිකරණ සෝෂක හා ප්‍රවේශක, පිස්කල් පියන්, පිස්කල් භාරකාර මාතා, අධිකරණ ආරක්ෂක වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග වලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සළකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කර ඇත.

03) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති මෙම අභියාචනා අතරින් ක්‍රියාත්මක විය යුතු දිනය සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කර නොමැති සියළු ස්ථාන මාරු වහාම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව වාර්ෂික ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස මෙයින් දන්වමි. ස්ථාන මාරු ක්‍රියාත්මක වීම සඳහා වෙනත් නිශ්චිත දිනයක් ලබා දී ඇති ස්ථාන මාරුවීම් ද එම දින සිට අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතු වේ.

04) එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2(ඇ) සහ (ඇ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

05) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි.

06) වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257(V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

07) එසේම ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සිතාසි බෙදන්නා හා ඇස්කීසි ක්‍රියාත්මක කරන්නා, අධිකරණ සෝෂක හා ප්‍රවේශක, පිස්කල් පියන්, පිස්කල් භාරකාර මාතා, අධිකරණ ආරක්ෂක 2024 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන ඉල්ලීම් හා ඒ සම්බන්ධයෙන් වන නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන සේවා ගණයේ සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා, අධිකරණ සෝෂක හා ප්‍රවේශක,පිස්කල් පියන්, පිස්කල් භාරකාර මාතා, අධිකරණ ආරක්ෂක වාර්ෂික ස්ථාන මාරු **2024** සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ

**සිතාසි බෙදන්නා සහ ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා තනතුර**

| අනු අංකය | නම | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලද ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|
| 1 | ඒ.කේ.නිශාන්ත කුමාර මහතා | දිසා මහේස්ත්‍රාත් අධිකරණය, උඩුගම | - | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |
| 2 | ඩී.එම්. සුසන්ත කුමාර මහතා | දිසා අධිකරණය, බලපිටිය | මහේස්ත්‍රාත් අධිකරණය, මතුගම | I. අභියාචනය නිෂ්ප්‍රභ කිරීම.<br>II.නව බඳවාගැනීම් සිදු කරන අවස්ථාවේදී අභියාචකගේ ඉල්ලීම සළකා බැලීමට කටයුතු කරන ලෙස දැන්වීම |
| 3 | ඒ.ජී.සමන් කුමාර මහතා | දිසා අධිකරණය, කොළඹ | නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණය | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |
| 4 | පී.ජී.ජී.කුෂාන් අසංක මහතා | මහාධිකරණය, බලපිටිය | - | I. අභියාචනය නිෂ්ප්‍රභ කිරීම.<br>II.නව බඳවාගැනීම් සිදු කරන අවස්ථාවේදී අභියාචකගේ ඉල්ලීම සළකා බැලීමට කටයුතු කරන ලෙස දැන්වීම |
| 5 | ඒ.එල්.අයි. මධුසංක මහතා | මහාධිකරණය, බලපිටිය | - | I. අභියාචනය නිෂ්ප්‍රභ කිරීම.<br>II.නව බඳවාගැනීම් සිදු කරන අවස්ථාවේදී අභියාචකගේ ඉල්ලීම සළකා බැලීමට කටයුතු කරන ලෙස දැන්වීම |
| 6 | එම්.ඩී.බී. ප්‍රනාන්දු මහතා | දිසා මහේස්ත්‍රාත් අධිකරණය, මොරටුව | මහාධිකරණය, පානදුර | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |
| 7 | එස්.පී.එස්.සී. සමරවර්ධන මහතා | මහේස්ත්‍රාත් අධිකරණය, මාවනැල්ල | මහාධිකරණය, මහනුවර | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |
| 8 | ඒ.ඒ. සමන් බන්දුල මහතා | මහේස්ත්‍රාත් අධිකරණය,දෙයියන්දර | මාතර සුළු හිමිකම් දිසා අධිකරණය | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |

30/07/2026

/07/2026

| | | | | |
|---|---|---|---|---|
| 9 | ඩබ්.බී.එම්.අජන්ත කුමාර මහතා | මහේස්ත්‍රාත් අධිකරණය,දෙහිඅත්තකණ්ඩිය | දිසා මහේස්ත්‍රාත් අධිකරණය, හිඟුරක්ගොඩ | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 10 | ආර්.ඒ.යෙෂ්මින් කාංචන කුමාර මහතා | මහාධිකරණය, රත්නපුර | මහාධිකරණය, අවිස්සාවේල්ල | I. අභියාචනය නිෂ්ප්‍රභ කිරීම.<br>II.නව බඳවාගැනීම් සිදු කරන අවස්ථාවේදී අභියාචකගේ ඉල්ලීම සළකා බැලීමට කටයුතු කරන ලෙස දැන්වීම |
| 11 | එච්.ජී.ජීවන් චමින්ද මහතා | දිසා මහේස්ත්‍රාත් අධිකරණය, තංගල්ල | මහාධිකරණය, මාතර | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |
| | | **පිස්කල් භාරකාර මාතා තනතුර** | | |
| 12 | කේ.ඒ.එච්.ජී.උදේශිකා රාජපක්ෂ මිය | මහාධිකරණය, හම්බන්තොට | මහාධිකරණය, තංගල්ල | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |
| 13 | එන්.ඩී.ආර්.එන්.යූ.කේ.ගුණසේකර මිය | මහාධිකරණය, හම්බන්තොට | මහාධිකරණය, තංගල්ල | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |
| 14 | ආර්.එම්.රූපසිංහ මිය | මහාධිකරණය,කෑගල්ල | මහාධිකරණය, අවිස්සාවේල්ල | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |
| 15 | ආර්.කේ.ජී. දිල්රුක්ෂි මිය | මහාධිකරණය,තංගල්ල | මහාධිකරණය, හම්බන්තොට | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය 2027.01.01 දක්වා දීර්ඝ කිරීම |

30/07/2026

30/07/2026.